ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 මට්ටම

අවසාන පරීක්ෂණය - 2023/2024

LLU 3901 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය 1

කාලය - පැය 3

---

දිනය -: 2025 මැයි 11 වේලාව -: ප.ව. 01.30 - ප.ව. 4.30

---

මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.

තෝරගත් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. 'ස්වස්ථානික භාවය පිළිබඳ මූලධර්මය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජන්ම භූමියෙහි මුල් බැසගෙන ඇත හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මාතෘ භූමියෙන් පැන නැගී ඇත, ආදී පාඨ වලින් විවිධාකාරයෙන් විස්තර කරනු ලැබ ඇත.'

R.K.W. Goonesekere and Jayantha Almeida Gunaratne, *Constitutional Law Block 1* (The Open University of Sri Lanka, 1984)12.

ඉහත ප්‍රකාශය අනුසාරයෙන් ශ්‍රී ලංකාවේ 1947 හා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ ස්වස්ථානිකභාවය යන සංකල්පය විස්තර කරන්න.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන හා නඩු තීන්දු නීතිය යටතේ වන උදාහරණ වෙත යොමු වෙමින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

2. දුමින්දු යනු ගාර්ලන්ඩ් නම් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සිටින අවුරුදු විසි දෙකක් වයසැති පළමු වසර විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකි.නාලක යනු එම විශ්ව විද්‍යාලයේම තෙවන වසරේ සිසුවකු වන අතර ඔවුන් අතර ඇති වූ ආරවුලක් හේතු කොටගෙන ඔහු දුමින්දු සමඟ අමනාපයෙන් පසුවිය.නාලකගේ පියා ගාර්ලන්ඩ්හි ප්‍රසිද්ධ දේශපාලනඥයෙකු වන අතර නාලක විසින් මෙම ආරවුල සම්බන්ධව තම පියාට පැමිණිලි කරන ලදී.

එක් දිනෙක විශ්ව විද්‍යාල නිවාඩු වලින් අනතුරුව දුමිඳු තම නිවසට යමින් සිටින අතරතුර දී මාර්ගය අවහිර කරමින් පොලිස් නිලධාරින් තිදෙනෙකු පැමිණ ඔහුගේ බෑගය පරීක්ෂා කර ඔහුට බරපතළ ලෙස පහර දෙන ලද්දේ ඔහුගේ බෑගය තුළ මත්ද්‍රව්‍යය තිබෙන බවට චෝදනා කරමිනි. පහරදීම අතරතුර නාලක සහ පියාද දුමිඳුට පහරදෙන ලදී.මෙම පහරදීම හේතුවෙන් දුමිඳුගේ හිසට බරපතල තුවාල සිදුවූ අතර රෝහල් ගතවීමට සිදුවිය.නාලකව සහ ඔහුගේ පියාව තවමත් අත්අඩංගුවට ගෙන නොමැත.

මෙම සිදුවීම සැලවීමෙන් අනතුරුව දුමිඳුගේ එක් මිතුරෙකු 'යුක්තියද,අයුක්තියද?ගාර්ලන්ඩිහි නීතියේ ආධිපත්‍යය නැවත ඇගයීම'යන මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් ලිවීමට අදහස් කරයි.
ඔබ නීති ශිෂ්‍යයෙකු බැවින් එහි අන්තර්ගත විය යුතු නෛතික කරුණු සම්බන්ධයෙන් ඔහු ඔබගේ උපදෙස් පතයි.නීතියේ ආධිපත්‍යය යන සංකල්පය සහ ඊට අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සම්බන්ධයෙන් ඔහුට උපදෙස් දෙන්න.
ගාර්ලන්ඩිහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව සලකන්න.

**(ලකුණු 20)**

3. 'ව්‍යවස්ථාදායකයකට පවරා ඇති ව්‍යවස්ථාදායක බලයෙහි ස්වභාවය නිර්ණය කිරීම, නීති සම්පාදන ක්‍රියාවලිය තුලදී රාජ්‍යයක ප්‍රජාතන්ත්‍රික මූලධර්ම හා අගයන් ආරක්ෂා කිරීමෙහිලා බෙහෙවින් වැදගත් වේ'.

ව්‍යවස්ථාදායක පරමාධිපත්‍ය යන සංකල්පයට අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශය ශ්‍රී ලංකාවේ 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඇසුරින් විවේචනාත්මකව විග්‍රහ කරන්න.ඔබගේ පිළිතුරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන, උදාහරණ හා නඩු තීන්දු නීතිය සහාය කරගන්න.

**(ලකුණු 20)**

4. පෝල් මහතා නොරිකො ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අලුතින් පත් කරන ලද ජනාධිපතිවරයා වේ.ඔහු විසින් මෑතකදී ගනු ලැබූ ඇතැම් තීරණ නොරිකො රාජ්‍යයෙහි මතභේදයන්ට ලක් වී ඇත.

අ. පාර්ලිමේන්තු සාමාජිකයන්ගේ කැමැත්ත නොමැතිව නොරිකොහි පාර්ලිමේන්තුව රැස්වී වසරක් ගතවීමෙන් පසුව පෝල් මහතා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. **(ලකුණු 05)**

ආ. ඔහුගේ උපදේශකවරයාව ජනාධිපතිවරයා ලෙස පත්කරමින් සිය සෞඛ්‍යමය ගැටලු හේතුවෙන් පෝල් මහතා බලාපොරොත්තු නොවූ පරිදි ඉල්ලා අස්වීමට සූදානම් වේ.ඔහු පවසන්නේ පාර්ලිමේන්තුව සහ අධිකරණය ඔහුගේ තීරණයට එකඟ විය යුතු බවයි.

(ලකුණු 05)

ඇ.පෝල් මහතා ඔහුගේ ආර්ථික ප්‍රතිපත්තීන් විවේචනය කරන ලද මාධ්‍යවේදියෙකුව අත්අඩංගුවට ගන්නා ලෙස නියෝග කරයි.ඔහු ප්‍රකාශ කරනුයේ තමා නොරිකො රාජ්‍යයෙහි ජනාධිපතිවරයා බැවින් තමාට එරෙහිව ජනමාධ්‍යවේදියා විසින් නඩු පැවරිය නොහැකි බවයි.

(ලකුණු 05)

ඈ.පෝල් මහතා නොරිකොහි පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය දිනාගෙන නොමැති සායි මහත්මියව අගමැතිනිය ලෙස පත්කරයි. (ලකුණු 05)

නොරිකො ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරමින් ඔහු විසින් ගනු ලැබ ඇති ඉහත තීරණයන්හි හා ක්‍රියාවන්හි වලංගු භාවය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(මුළු ලකුණු 5 x 4 = 20)

5. 'බලය තනි පුද්ගලයෙකු විෂයෙහි හෝ පුද්ගල කණ්ඩායමක් මත සංකේන්ද්‍රගත වී පවතින්නේ නම් එමඟින් ඒකාධිපති ස්වරූපයේ ආණ්ඩුවක් බිහිවිය හැක.ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන එකිනෙකට වෙනස් පුද්ගලයන් ගෙන් සමන්විත විය යුතුය.'

De Smith S.A., *Constitutional and administrative law* (3rd edn, Penguin Books, New York 1981)36.

බලතල බෙදීමේ සංකල්පයෙහි විෂය පථය සහ අදාලත්වය පිළිබඳ ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙත අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

ඔබගේ පිළිතුරට අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු නීතිය ඇසුරින් තහවුරු කරන්න.

(ලකුණු 20)

හිල්වුඩ්ලන්ඩ් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි පැවැති ජාතික ආගමික උත්සවයකට ජානු හා රනාත්ගේ ඇතුලත් වීම ප්‍රතික්ෂේප කරන ලදි.එම අවස්ථාවට ඇතුළත් වීමේ ඔවුන්ගේ ඉල්ලීම ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍යාංශ නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කරන ලදි.

ඔවුන් ප්‍රකාශ කරන ලද්දේ එහි විශාල ජනකායක් රැස්ව සිටි බැවින් පොදු ආරක්ෂක හේතූන් මත කිසිදු අයෙකුට ඇතුළත් වීමට ඉඩ නොදෙන බවයි.

කෙසේ නමුත් එම සීමාව නොතකා හරිමින් අමාත්‍යාංශ නිලධාරීන් විසින් සිය ඥාතීන් හට එම භූමියට

ඇතුලත් වීමට අවසර දෙන ලදී.

ආගමික උත්සවයට සහභාගී වීමට අවසර නොලද සියලුම පිරිස වෙනුවෙන් ජානු සහ ජනත් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීමට බලාපොරොත්තු වේ.

ඔවුන්ට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ හැකිද ,යන්න සම්බන්ධයෙන් ඔවුන් ඔබගේ උපදෙස් පතයි.හිල්වුඩ්ලන්ඩ්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරමින් අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය උපයෝගී කර ගනිමින් ඔවුන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

7. 'අධිකරණ ස්වාධීනත්වය යනු සාධාරණ සමාජයක නිහඬ ශක්තියකි.එය යුක්තියෙහි සුපරීක්ෂාකාරී ආරක්ෂකයෙකු වන අතර නීතියේ ආධිපත්‍යය පවතින්නේද අධිකරණයේ ස්වාධීනත්වය කරණ කොට ගෙනය.'

ඔබ ඉහත ප්‍රකාශය සමග එකඟ වන්නේද?

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ 'අධිකරණ ස්වාධීනත්වය' යන සංකල්පයෙහි විෂය පථය සහ අදාළත්වය සම්බන්ධව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

අවශ්‍ය අවස්ථාවන්හීදී ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන, නඩු තීන්දු නීතිය සහ උදාහරණ මඟින් තහවුරු කරන්න.

(ලකුණු 20)

8. පහත දැක්වෙන මාතෘකා අතරින් <u>ඕනෑම හතරක්</u> **(04)** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

අ. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ.

ආ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය.

ඇ. සමානුපාතික නියෝජන ක්‍රමය.

ඈ. ජනමත විචාරණය.

ඉ. ඔම්බුඩ්ස්මන්ධූරය.

**(මුළු ලකුණු 5 x 4 = 20)**

****සියලුම හිමිකම් ඇවිරිණි****